ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ සහ අමාත්‍ය මණ්ඩලයේ දිවුරුම් දීමේ උත්සවයට ඉන්දියාවේ අසල්වැසි රාජ්‍යයන්ගේ සහ ඉන්දියානු සාගර කලාපයේ රටවල නායකයන් රැසක්</u>

අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ සහ අමාත්‍ය මණ්ඩලයේ දිවුරුම් දීමේ උත්සවය 2024 ජූනි 09 වන දින රාෂ්ට්‍රපති භවන්හිදී පැවැත්විණ. ඉන්දියාවේ අසල්වැසි රාජ්‍යයන්ගේ සහ ඉන්දියානු සාගර කලාපයේ රටවල නායකයන් රැසක් ගෞරවනීය අමුත්තන් ලෙස මෙම අවස්ථාවට සහභාගී වූහ.

2. ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ, මාලදිවයින් ජනාධිපති ආචාර්ය මොහොමඩ් මුයිසු, සීෂෙල්ස් උප ජනාධිපති අහමඩ් අෆිෆ්, බංග්ලාදේශ අග්‍රාමාත්‍ය ෂීක් හසීනා, මොරිෂස් රාජ්‍යයේ අග්‍රාමාත්‍ය ප්‍රවින්ද් කුමාර් ජුග්නොත් සහ එම ආර්යාව, නේපාල අග්‍රාමාත්‍ය පුෂ්ප කමල් දහාල් ‘ප්‍රචණ්ඩා’ සහ භූතාන අග්‍රාමාත්‍ය ෂෙරින්ග් ටොග්බේ යන මහත්ම මහත්මීන් උත්සවයට සපැමිණි අමුත්තන් අතර විය. මාලදිවයින, බංග්ලාදේශය, නේපාලය සහ භූතානය යන රටවල නායකයන් සමඟ අමාත්‍යවරුන් ද පැමිණ සිටියහ.

3. දිවුරුම් දීමේ උත්සවයෙන් අනතුරුව, අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා පැමිණ සිටි නායකයන් රාෂ්ට්‍රපති භවන් හිදී හමු විය. ඓතිහාසික තෙවන වරටත් ඉන්දියාවේ අග්‍රාමාත්‍යවරයා ලෙස දිවුරුම් දීම සම්බන්ධයෙන් නායකයෝ මෝදි මැතිතුමාට සිය සුබ පැතුම් පළ කළහ. දිවුරම් දීමේ උත්සවයට සහභාගී වීම වෙනුවෙන් ඔවුන්ට ස්තුති කළ අග්‍රාමාත්‍යතුමා ‘අසල්වැසියා ප්‍රථමයෙන්’ සහ ‘SAGAR’ යන දැක්ම සඳහා ඉන්දියාවේ කැපවීම සහතික කළේය. සිය තෙවන ධුර කාලයේදී වසර 2047

වන විට වික්සිත් භාරත් (සංවර්ධිත ඉන්දියාවක්) යන ඉලක්කය හඹා යන අතරතුර පවා ඉන්දියාව කලාපයේ සාමය, ප්‍රගතිය සහ සෞභාග්‍යය වෙනුවෙන් අඛණ්ඩව කටයුතු කරන බව අග්‍රාමාත්‍යතුමා අවධාරණය කළේය. මෙම සන්දර්භය තුළ ජනතාව අතර වඩා ගැඹුරු බැඳීම් ඇති කළ යුතු බව සහ කලාපයේ සම්බන්ධකතාවය ඉහළ නැංවිය යුතු බව එතුමා ප්‍රකාශ කළේය. ජාත්‍යන්තර වේදිකාව තුළ ඉන්දියාව තවදුරටත් ගෝලීය දකුණේ හඬ තීව්‍ර කිරීමට කටයුතු කරන බව ද එතුමා සඳහන් කළේය.

4. නායකයන් ජනාධිපති ශ්‍රීමති ද්‍රෞපදි මුර්මු මැතිනිය විසින් රාෂ්ට්‍රපති භවන් හිදී පිරිනමනු ලැබූ භෝජන සංග්‍රහයකට ද සහභාගි විය. ඔවුන් පිළිගත් ජනාධිපතිනිය ජාතියට සේවය කිරීම සඳහා අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමාට සිය සුභාශිංසන එක් කළ අතර ඉන්දියාවේ ප්‍රජාතාන්ත්‍රික ව්‍යායාමය ඉන්දීය ජනතාවට ආඩම්බරයට කරුණක් පමණක් නොව ලොව පුරා මිලියන ගණනක ජනතාවට ආදර්ශයක් ද වන බව ප්‍රකාශ කළාය.

5. ඉන්දියාවේ අසල්වැසි රාජ්‍යයන්ගේ සහ ඉන්දියානු සාගර කලාපයේ රටවල නායකයන් අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමාගේ සහ අමාත්‍ය මණ්ඩලයේ දිවුරුම් දීමේ උත්සවය සඳහා සහභාගී වීම කලාපය සමඟ ඉන්දියාවේ ගැඹුරින් මුල් බැස ගත් සබඳතා සහ සහයෝගය අවධාරණය කරයි.

***

***කොළඹ***
***2024 ජූනි 10***

මූලාශ්‍රය: [https://www.mea.gov.in/press-releases.htm?dtl/37858/Participation+of+leaders+from+Indias+neighbourhood+and+Indian+Ocean+region+in+the+swearingin+ceremony+of+Prime+Minister+and+Council+of+Ministers](https://www.mea.gov.in/press-releases.htm?dtl/37858/Participation+of+leaders+from+Indias+neighbourhood+and+Indian+Ocean+region+in+the+swearingin+ceremony+of+Prime+Minister+and+Council+of+Ministers)